**විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# ප්‍රසම්පාදන දැන්වීමයි

## ප්‍රධාන කාර්යාලයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම

## PR/02/01-01

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් කාර්යාංශය තුළ පිහිටි ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා සුදුසුකම්ලත් සහ නිපුණතා සහිත ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවයි.

01. මේ පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු බත්තරමුල්ල, කොස්වත්ත ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234, 2 වන මහල ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) ප්‍රසම්පාදන කළමනාකරු වෙතින් 2026.09.07 දින සිට 2026.09.28 දක්වා, පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අතර තුර කාලයේදී දුරකථන අංකය : 011-2887585, විද්‍යුත් තැපැල : mgr_procurement@slbfe.lk මගින් ලබාගත හැකිය.

02. ඉහත ලිපිනයේ පිහිටි ප්‍රසම්පාදන අංශයේදී, 2026.09.07 සිට 2026.09.28 දක්වා වැඩ කරන දිනයන්හිදී, කාර්යාල වේලාව තුළ ලංසුකරුවන්ට ගාස්තු ගෙවීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

03. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) කළමනාකරු (ප්‍රසම්පාදන) වෙත, සමාගමේ ලිපි ශීර්ෂය සහිත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර, ආපසු නොගෙවන ගාස්තුවක් ලෙස රුපියල් පන්දහසක (රු. 5,000.00) මුදලක් ගෙවීමෙන් පසු, වැඩ කරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා වූ කාර්යාල වේලාවන් තුළ සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් ලබා ගත හැක. ගෙවීම් මුදලින් පමණක් කළ යුතුය.

04. ලංසු ලේඛනය මිලදී ගැනීමේ ඉල්ලීම සමග BRC (ව්‍යාපාර ලියාපදිංචි සහතිකය) හි සහතික කළ පිටපතක් සහ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය. එහි සත්‍යතාව තහවුරු කර ගැනීමෙන් පසු මුල් පිටපත නැවත ලබා දෙනු ලැබේ. මීට අමතරව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරන ලද යහපත් නිෂ්පාදන පිළිවෙත් හා ආහාර ආරක්ෂාව පිළිබඳ (Good Manufacturing Practice for food safety) සහතිකය ඉදිරිපත් කිරීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

05. මෙම ප්‍රසම්පාදනය සඳහා සුදුසුකම් ලැබීමට නම්, ලංසුකරු / ලංසුකරුවන් විසින් ලංසු ලේඛනවල දක්වා ඇති අවම සුදුසුකම් අවශ්‍යතා සපුරාලිය යුතුය.

06. ලංසුව අඩංගු මුද්‍රා තැබූ කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**ප්‍රධාන කාර්යාලයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා වන ලංසු කැඳවීම**" (PR/02/01-01) ලෙස සටහන් කළ යුතු අතර, එය දෙවන මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටි (අංක 01) බහාලිය යුතුය. ටෙන්ඩර් පෙට්ටිය 2026.09.29 දින පෙ.ව. 10.00 ට වසා දමනු ලබන අතර, ඉන් අනතුරුව වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීමේ අවස්ථාව සඳහා ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර ගනු නොලැබේ.

07. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා රුපියල් පනස් දහසක (50,000/-) "ලංසු ඇපකරයක්" (Bid Security) ඉදිරිපත් කළ යුතුය. මෙම ඇපකරය ලංසු භාරගැනීම අවසන් වන දින සිට දින 119 ක කාලයක් සඳහා වලංගු විය යුතු අතර, එය ලංසුව සමගම ඉදිරිපත් කළ යුතුය.

08. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයාට කිසිදු හේතුවක් නොදක්වා ඕනෑම ලංසුවක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අයිතිය ඇත. ලංසු සකස් කිරීමේදී හෝ ඉදිරිපත් කිරීමේදී ලංසුකරුවන් දරන කිසිදු වියදමක් සම්බන්ධයෙන් කමිටුව වගකීමක් නොදරයි.

**සභාපති,**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**
**දුරකථන / ෆැක්ස් : 011-2887585 / 2880564**
**Email : mgr_procurement@slbfe.lk**